සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **කතෝලික ධර්මය I** **කාලය පැය 1 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. දේව අනාවරණයේ ලිඛිත මූලාශ්‍රය වන්නේ,
(1) මහෝපදේශය යි. (2) ශුද්ධ බයිබලය යි.
(3) විශ්ව ලේඛනයයි. (4) කතෝලික සභා සම්ප්‍රදායයි.

02. ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ අපෝස්තුලුවරු සුබ අස්න දේශනා කිරීම පටන් ගනු ලැබුවේ,
(1) ජෙරුසලමෙන් හා ජුදයාවෙන් ය. (2) ජෙරුසලමෙන් හා අන්තියෝකියෙන් ය.
(3) ජෙරුසලමෙන් හා ගලාතියෙන් ය. (4) ජෙරුසලමෙන් හා ග්‍රීසියෙන් ය.

03. A - 2 තෙසලෝනික / 1 තිමති / 2 තිමති / තීතස්
B - රෝම / 1 කොරෙන්ති / ගලාති / පිලිප්පි
C - 1 තිමති / 2 තිමති / එපීස / කොලොස්සි
D - 2 තෙසලෝනික/ ගලාති / පිලිප්පි / පිලමොන්
ඉහත වරණ අතුරෙන් ආරූඪ කර්තෘත්වයට අයත් හසුන් ඇතුළත් වරණය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

04. විශ්වය හා පූර්ණත්වය සඳහා භාවිතා කර ඇති සංඛ්‍යා සංකේත වන්නේ,
(1) 4 හා 10 ය. (2) 7 හා 10 ය. (3) 4 හා 12 ය. (4) 4 හා 7 ය.

05. දෙවියන් වහන්සේගේ ආඥා හා පනත් රක්ෂා කරමින් උන්වහන්සේගේ මාර්ගවල හැසිරෙන්නේ නම් ආයුෂ වැඩි කරන බව පවසන්නේ,
(1) සාවුල්ට ය. (2) සාමුවෙල්ට ය. (3) සලමොන්ට ය. (4) ජොනතන්ට ය.

06. ජුදයින් අතට පත් වූ ජේසුස් වහන්සේ පසුදා පහන් වූ විට රැගෙන යනු ලබන්නේ,
(1) උත්තම පූජකයාගේ මැදුර වෙතය. (2) ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයට ය.
(3) ආණ්ඩුකාර පිලාත් වෙතය. (4) හෙරෝද් ඇන්ටිපස් වෙතය.

07. ''මාගේ ස්වාමීනි, මාගේ දෙවියනි'' යයි පවසමින් තම විශ්වාසය ප්‍රබල ලෙස ප්‍රකාශ කරනු ලැබුවේ,
(1) සකේවුස් ය. (2) ජුදාස් ය. (3) පේදුරු තුමාය. (4) තෝමස් තුමාය.

08. A - උපස්ථායකයකු ලෙස කටයුතු කරන ලදී.
B - සුබ අස්න දේශනා කළේය.
C - ගල් ගසා මරා දමන ලදී.
D - ශුද්ධවූ සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා ය.
ඉහත ප්‍රකාශ අදාළ වන්නේ,
(1) ශුද්ධ වූ මහා ජාකොබ් තුමාට ය. (2) ශුද්ධ වූ ස්තේපන් තුමාට ය.
(3) ශුද්ධ වූ පේදුරු තුමාට ය. (4) ශුද්ධ වූ පාවුලු තුමාට ය.


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

09. ''ඔබ ක්‍රිස්තුවරයාණෝය. ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය.'' පේදුරුතුමා මෙම ප්‍රකාශය කරනු ලබන්නේ,

(1) අන්තියෝකියේදී ය. (2) ජෙරුසලමේදී ය.
(3) තාර්සස්හිදී ය. (4) පිලිප්පි කයිසාරියේදී ය.

10. ශුද්ධ වූ සභාව සකල මිනිස් වර්ගයා වෙතට දූත මෙහෙවර සඳහා ක්‍රිස්තුන් වහන්සේ විසින් යවා ඇති නිසා එය / ඇය,

(1) ශුද්ධවත් වේ. (2) කතෝලික වේ. (3) අපෝස්තලික වේ. (4) සාධාරණ වේ.

11. කතෝලික ජන වන්දනාවේ කේන්ද්‍රස්ථානය මෙන්ම අග්‍රස්ථානය හිමි වන්නේ,

(1) දේව ප්‍රසාද නිධාන වලට ය. (2) දස පනතට ය.
(3) ශුද්ධ ලියවිල්ලට ය. (4) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ය.

12. ''මේ කුසලාන මාගේ රුධිරයෙන් පිහිටුවන නව ගිවිසුමය.'' දිව්‍ය සත්ප්‍රසාදය ගිවිසුමක් බව සඳහන් කරන්නේ,

(1) ලූක් සුවිශේෂයේ ය. (2) 1 කොරෙන්ති ලිපියේ ය.
(3) මාර්ක් සුවිශේෂයේ ය. (4) 2 කොරෙන්ති ලිපියේ ය.

13. මුල් කිතුනු සංඝය ප්‍රේමය හා සේවය අතපසු කරමින් දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට ............ වී ඇති බව ප්‍රකාශ කරන්නේ,

(1) ශුද්ධ වූ පේදුරු තුමා ය. (2) ශුද්ධ වූ පාවුලු තුමා ය.
(3) ශුද්ධ වූ ලූක් තුමා ය. (4) ක්‍රිස්තුන් වහන්සේ ය.

14. මතෙව් තුමා සඳහන් කරන පරිදි ජාතීන්ගේ විනිශ්චය දිනයේ දී ක්‍රිස්තුන් වහන්සේ යොදා ගන්නා මිනුම් දණ්ඩ වන්නේ,

(1) ප්‍රසාද නිධාන යි. (2) යාච්ඤාවේ ජීවිතයයි.
(3) මයෑදාවයි. (4) ශාරීරික පුන්‍ය ක්‍රියායි.

15. පළමු පනත හා අත්වැල් බැඳගෙන යාච්ඤාව තුළ සම්පූර්ණත්වයට පත් වන්නේ,

(1) බලාපොරොත්තුව, ආදරය හා කරුණාව යි. (2) විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය යි.
(3) විශ්වාසය, ආදරය හා කරුණාවයි. (4) දයාව, ඉවසීම හා විශ්වාසය යි.

16. ''ඔබ අතරින් යමෙක් ප්‍රධානියා වන්න කැමැත්තේ නම් ඔහු ඔබේ දාසයා වන්නේය.'' යන ක්‍රිස්තු ඉගැන්වීම අදාල වන්නේ,

(1) සමාජයේ ජනතාවට ය. (2) සමාජ නායකයන්ට ය.
(3) දෙමව්පියන්ට ය. (4) පූජක පක්ෂයට ය.

17. කතෝලික සභාවේ ඉගැන්වීම් අනුව අන් සතු දේ අයුතු ලෙස ලබා ගැනීම හා ඒවාට ආශා කිරීම කුමන දේව පනත්වලට විරුද්ධ ක්‍රියාවන් ද?

(1) 7 සහ 10 (2) 7 සහ 9 (3) 6 සහ 10 (4) 8 සහ 10

18. කතෝලික සභා සම්ප්‍රදායේ දක්වන අන්දමට විශ්වාසයේ සත්‍යතා සඳහා දෙනු ලබන උතුම්ම සාක්ෂිය වන්නේ,

(1) යාච්ඤාවේ ජීවිතය යි. (2) දුක් කරදර විඳගැනීම යි.
(3) ප්‍රාණ පරිත්‍යාගී වීම යි. (4) අවංකව ජීවත් වීම යි.

19. පහත සඳහන් කර ඇති දිව්‍ය පූජාවේ පිළිවෙත් නිවැරදිව පෙළ ගස්වා ඇති වරණය වන්නේ,

A - ආරම්භක පිළිවෙත
B - පුදසුන සූදානම් කිරීමේ පිළිවෙත
C - ස්තෝත්‍ර යාගික පිළිවෙත
D - දේව වාක්‍යය පිළිවෙත
E - ධර්මදූත කාර්යය සඳහා පිටත් කර යැවීමේ පිළිවෙත

(1) A, B, C, D, E (2) A, D, B, C, E (3) A, C, D, B, E (4) B, C, A, D, E

20. උත්තම පූජක යාච්ඤාවෙන් පසු ගෙත්සමනෙට පැමිණි ක්‍රිස්තුන් වහන්සේ සිය ශ්‍රාවකයන් අමතා වදාළේ,
   (1) ''මා යාච්ඤා කරන අතර ඔබ මෙහි සිටින්න'' යනුවෙනි.
   (2) ''මා ලෝකයෙන් නො වෙන්නාක් මෙන් ඔව්හුද ලෝකයෙන් නොවෙති'' යනුවෙනි.
   (3) ''ඔබ වහන්සේ මට බාරදුන් මෙහෙය සම්පූර්ණ කරමින් මිහිපිට ඔබ මහිමයට පැමිණෙව්වෙමි'' යනුවෙනි.
   (4) ''ඔබ මට පැවසූ වචන මට ඔවුන්ට'' පැවසීමි යනුවෙනි.

21. ඊශ්‍රායල් ජනතාවගේ කාන්තාර ගමන ගැන කරුණු ඉදිරිපත් කරන ග්‍රන්ථය වන්නේ,
   (1) නික්මයාම ය. (2) උත්පත්ති ය. (3) ගණන් කථාවය. (4) ලෙවී ව්‍යවස්ථාවයි.

22. එලොහිම් සම්ප්‍රදායට අයත් සිදුවීම් දෙකක් වන්නේ,
   (1) පළමු මැවීමේ කතාව හා නෝවා සමඟ ගිවිසුම
   (2) දෙවන මැවීමේ කතාව හා කායින් ආබෙල් සිද්ධිය
   (3) ඊසාක් පූජා කිරීම හා ජාකොබ් තුමා බෙතෙල් හි දුටු දර්ශනය
   (4) ආදම් ඒව පාපයට වැටීම හා නෝවා සමඟ ගිවිසුම

23. නව ගිවිසුමේ කතුවරුන් තම ග්‍රන්ථ ලේඛන ගත කිරීමේ දී බොහෝ විට භාවිතා කර ඇත්තේ,
   (1) හෙබ්‍රෙව් පිටපත ය. (2) ජුදා මූලාශ්‍ර ය.
   (3) මැසරොටික් පිටපත ය. (4) ග්‍රීක පිටපත ය.

24. ''සෙප්ටුවාජින්තය'' යන වචනයෙහි අර්ථය වන්නේ,
   (1) හැත්තෑව ය. (2) පනහ ය. (3) දහය ය. (4) හත ය.

25. ප්‍රධාන දිවැසිවරු පමණක් ඇතුළත් වරණය වන්නේ,
   (1) යෙසායා, සෙකරියා (2) එසකියල්, ජෝනා
   (3) ජෙරමියා, හොසියා (4) යෙසායා, ජෙරමියා

26. දේව මාලිගයේ දර්ශනයක් දුටු දිවැසිවරයා,
   (1) එසකියල් ය. (2) ජෙරමියා ය. (3) යෙසායා ය. (4) ජෝවෙල් ය.

27. නීරෝ අධිරාජ්‍යයාගේ පීඩනයට ලක්වූ කිතුනුවන් දිරිමත් කිරීම පරමාර්ථය කරගත් සුබාරංචිය,
   (1) මාක් ය. (2) මතෙව් ය. (3) ලූක් ය. (4) ජොහාන් ය.

28. ලූක් සුබාරංචිය ලියන ලද කාලය හා ස්ථානය වන්නේ,
   (1) ක්‍රි.ව. 80-90 සිරියා පලස්තීනය. (2) ක්‍රි.ව. 90-100 එපීසිය
   (3) ක්‍රි.ව. 80-85 සිරියාවේ අන්තියෝකිය (4) ක්‍රි.ව. 64-66 රෝමය

29. ප්‍රාග් ඉතිහාසය ලෙස හඳුන්වනු ලබන්නේ උත්පත්ති පොතේ,
   (1) 1 පරිච්ඡේදයේ සිට 7 වන පරිච්ඡේදය දක්වා කොටස ය.
   (2) 1 පරිච්ඡේදයේ සිට 11 වන පරිච්ඡේදය දක්වා කොටස ය.
   (3) 1 පරිච්ඡේදයේ සිට 20 වන පරිච්ඡේදය දක්වා කොටස ය.
   (4) 1 පරිච්ඡේදයේ සිට 28 වන පරිච්ඡේදය දක්වා කොටස ය.

30. ප්‍රාග් ඉතිහාසය තුළ ඇති කතාන්දර වලින් අපට උගත හැක්කේ,
   (1) විද්‍යාත්මක තොරතුරු ය. (2) ඓතිහාසික තොරතුරු ය.
   (3) විශ්වාසයේ පණිවිඩයකි. (4) දේව ධාර්මික පණිවිඩයකි.

31. උත්පත්ති පොතේ තුන්වන පරිච්ඡේදයේ දැක්වෙන සර්පයාගෙන් සංකේතවත් කරන්නේ,
   (1) මිනිසා තුළ ඇති රුචිය යි. (2) විශ්වයේ ආරම්භය යි.
   (3) මිනිසා මැවීම යි. (4) විශ්වයේ පාලනය යි.

32. වරදට වැටුණු මිනිසාට දෙවියන් වහන්සේ දුන් දඬුවම් පහත දැක්වේ.

A - ''පොළොවට සාප වේවා!''

B - ''මින්මතු පොළෝ තලය මත සාප ලද්දෙක් වේවා!''

C - ''පොළොවෙන් නුඹ නෙරපා දමනු ඇත.''

D - ''නුඹ ගෙයක් දොරක් නැති මිහිපිට ඉබාගාතේ යන මිනිහෙක් වන්නෙහිය.''

ඉහත ප්‍රකාශ අතුරින් ආදම්ට දුන් දඬුවම වන්නේ,

(1) A (2) B (3) C (4) D

33. සත් ගුණවත් මිනිසෙකු වූ ඔහු ඔහුගේ පරම්පරාවේ නිදොස් මිනිසා වූ අතර දෙවියන් වහන්සේ සමඟ සුහදතාවයෙන් හැසිරුණේය. මෙම ප්‍රකාශය අදාල වන්නේ,

(1) ආබ්‍රහම්ට ය. (2) මෝසෙස්ට ය. (3) නෝවාට ය. (4) ජෝශප්ට ය.

34. ස්වාමීන් වහන්සේ අබිමුවෙහි ශ්‍රේෂ්ඨ වන ඔහු මිදි යුෂවත් මත්පැන්වත් නො බොන්නේය.'' මෙම ශ්‍රේෂ්ඨ පුද්ගලයා,

(1) පේදුරු ය. (2) පාවුලු ය.

(3) දාවිත් ය. (4) ස්නාවක ජොහාන් ය.

35. කීර්තිය පතා කටයුතු නොකළ යුතු බව ජේසුස් වහන්සේ අපට පැහැදිලි කරන්නේ,

(1) පළමු පරීක්‍ෂාව මඟිනි. (2) තුන්වන පරීක්‍ෂාව මඟිනි.

(3) භාග්‍ය අට මඟිනි. (4) දස පනත මඟිනි.

36. ඒකත්වය හා අඛණ්ඩත්වය යන ලක්‍ෂණ දෙක අයත් වන්නේ,

(1) කිතුනු විවාහයට ය. (2) පූජක දිවියට ය.

(3) මුල් කිතුනු සභාවට ය. (4) ශුද්ධවූ සභාවට ය.

37. A - ව්‍රත ශුද්ධිය B - විශ්වාසය C - කීකරුකම D - දිළිඳුකම

මේ අතරින් පැවිදි වේදභාර ඇතුළත් වරණය වන්නේ,

(1) A, B, C ය. (2) B, C, D ය. (3) A, C, D ය. (4) A, B, D ය.

38. මරිය හමුදාව ආරම්භ කරන ලද්දේ,

(1) ජේසුස් වහන්සේ විසිනි.

(2) අති උතුම් ලියෝ ජෝශප් කාදිනල් හිමිපාණන් විසිනි.

(3) ෆ්‍රෑන්ක් ඩෆ් මහතා විසිනි.

(4) භාග්‍යවන්ත පෙඩ්රික් ඕසනාම් තුමා විසිනි.

39. ''අබාද්'' යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය වන්නේ,

(1) සංරක්‍ෂණය කිරීම ය. (2) රැක බලා ගැනීම ය.

(3) ආදරය කිරීම ය. (4) වැඩ කරමින් නිර්මාණය කිරීම ය.

40. A - දුකින් පෙළෙන්නන් සැනසීම

B - වහලුන් නිදහස් කිරීම

C - අඥාණයන්ට ඉගැන්වීම

D - වැරදි කමා කිරීම

ආත්මික පුණ්‍ය ක්‍රියා පමණක් සඳහන් වන වරණය වන්නේ,

(1) A, B, C ය. (2) B, C, D ය. (3) A, B, D ය. (4) A, C, D ය.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **කතෝලික ධර්මය II** **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

01. (i) ශුද්ධ වූ පාවුලුතුමා සමඟ පළමු ධර්මදූත ගමනට සහභාගි වූ අනෙක් පුද්ගලයින් දෙදෙනා කවුද?

(ii) දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් දෙකක් ලියන්න.

(iii) කතෝලික සභා ධර්මෝපදේශයට අනුව දේව ප්‍රේමයට විරුද්ධ පව් දෙකක් ලියන්න.

(iv) නත්තල් සමය තුළ සමරන වැදගත් මංගල්‍යයන් දෙකක් ලියන්න.

(v) මල් උයනේ යාච්ඤාවෙන් පෙන්නුම් කරන කරුණු දෙක ලියන්න.

(vi) දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ දෙකක් ලියන්න.

(vii) ස්නාවක ජොහාන් තුමා ජනතාවට හා අයකැමියන්ට දුන් උපදෙස් දෙකක් ලියන්න.

(viii) වපුරන්නා පිළිබඳ උපමාවේ සඳහන් බීජ වැටුණු බිම්වර්ග (ස්ථාන) දෙකක් ලියන්න.

(ix) සමගි සන්ධානයේ දේව ප්‍රසාදය තුළින් ලැබෙන වරප්‍රසාද දෙකක් ලියන්න.

(x) නිල පූජකවරයේ ධුර දෙකක් නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

02. (i) අභිධාර්මික ප්‍රඥාව පිළිබඳව කරුණු ඇතුළත් ග්‍රන්ථ දෙක නම් කරන්න.

(ii) ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යම ස්වරූප තුනක් උදාහරණ සහිතව ලියන්න.

(iii) දෙවියන් වහන්සේට ප්‍රසන්න දැහැමි ජීවිතයක් ගත කිරීමට ඔබ ප්‍රඥාවන්තව කටයුතු කරන්නේ කෙසේද කරුණු පහකින් ලියා දක්වන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03. (i) යාග පැවැත්වීමේ පරමාර්ථ දෙක ලියන්න.

(ii) දවන පූජා ප්‍රධාන වශයෙන් බෙදෙන වර්ග තුනක් සඳහන් කරන්න.

(iii) ''පරිත්‍යාගශීලී ජීවිතයක් ගත කිරීම කිතුනු මගේ වගකීමයි.'' පුවත්පතක පළ කිරීමට ලිපියක් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

04. (i) නිර්මල පිවිතුරු දිවියක් ගත කිරීමට මඟ පෙන්වන දේව පනත් දෙක ලියන්න.

(ii) මයර්‍යාදාව ඇතිව දිවි ගෙවීමට කළ යුතු කාර්යයන් තුනක් ලියන්න.

(iii) හැඟීම් හා ආශාවන්ට වහල් වී තරුණ ජීවිත විනාශ වන මෙවන් යුගයක ශුද්ධ වූ මරියගොරෙත්ති තුමියගේ ජීවිතයෙන් ගත හැකි මඟ පෙන්වීම් පහක් ලියන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

05. (i) ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්දනය කිරීමට මිසරයේ රජතුමා ගත් පියවර දෙකක් ලියන්න.

(ii) සාමාන්‍ය සමාජයේ දක්නට ලැබෙන ගිවිසුම්වලට වඩා ශුද්ධ බයිබලයේ දක්නට ලැබෙන ගිවිසුම්වල ඇති වෙනස්කම් තුනක් ලියන්න.

(iii) ප්‍රසාද ස්නාපනය මඟින් දිවැසිවර කැඳවීම ලැබූ ඔබ එම කැඳවීමට සාක්ෂි දරන්නේ කෙසේද කරුණු පහකින් ලියන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

06. (i) පැවිදි නිකායන් කොටස් දෙක නම් කරන්න.

(ii) පැවිදි ජීවිතයේ ලක්ෂණ තුන නම් කරන්න.

(iii) පැවිදි ජීවිතවලට එල්ල වන අභියෝග ජය ගැනීමට, ඔවුනට අවශ්‍ය ශක්තිය ධෛර්ය ඉල්ලා ගැලවුම්කාර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට යාච්ඤාවක් ලියන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

07. පහත සඳහන් මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) පෙන්තකොස්තය

(ii) තෙරේසා මව්තුමිය

(iii) ආශිර්වාදකාර බන්ධනය

(iv) ස්නාවක ජොහාන් තුමා

(ලකුණු $5 + 5 = 10$)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (2) | 02. (1) | 03. (3) | 04. (4) | 05. (3) | 06. (2) | 07. (4) | 08. (2) | 09. (4) | 10. (2) |
| 11. (4) | 12. (2) | 13. (2) | 14. (4) | 15. (2) | 16. (2) | 17. (1) | 18. (3) | 19. (2) | 20. (1) |
| 21. (3) | 22. (3) | 23. (4) | 24. (1) | 25. (4) | 26. (3) | 27. (1) | 28. (3) | 29. (2) | 30. (4) |
| 31. (1) | 32. (1) | 33. (3) | 34. (4) | 35. (2) | 36. (1) | 37. (3) | 38. (3) | 39. (4) | 40. (4) |

(ල. 40)

## II පත්‍රය

01. (i) බර්ණබස්තුමා හා ජොහාන් මාක්තුමා
(ii) පූප කැඩීම, ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය, නව පාස්කු මංගල්‍යය, ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ සහභාගි කම
(iii) දේව ආදරය පිළිබඳ මෙනෙහි නොකිරීම, දේව ප්‍රේමයට ප්‍රතිචාර නොදැක්වීම, දිව්‍යමය වූ යහපතින් කෙනෙකුව වලක්වාලීම, උඩගුවෙන් දෙවියන් වහන්සේව ප්‍රතික්ෂේප කිරීම
(iv) ක්‍රිස්තෝත්පත්ති මංගල්‍යය, ශුද්ධ වූ පවුලේ මංගල්‍යය, පාරිශුද්ධ දේවමාතාවන්ගේ මංගල්‍යය, දිව්‍ය බිළිඳු රජුන්ට ප්‍රත්‍යක්ෂවීමේ මංගල්‍යය
(v) ජේසුස් වහන්සේගේ සැබෑ මනුෂ්‍යත්වය, දෙවියන් වහන්සේ හා ක්‍රිස්තුන් වහන්සේ අතර ඇති සබැඳියාව, ඔවුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය
(vi) ධ්‍යානයට සම වැදීම, කණ්ඩායම් වශයෙන් මෙහෙවරෙහි යෙදීම, තම දූත මෙහෙවර සනාථ කිරීම සඳහා හාස්කම් කිරීම
(vii) අඳන දෙකක් ඇති අය නැති අයට දෙන්න, නියමිත පමණට වැඩියෙන් අයබදු නොගන්න
(viii) මග දිගේ, පස් නැති ගල් බිම, කටු අතර, සරු බිම
(ix) බිඳ වැටුණු සබඳතාව නැවත ගොඩ නැගෙයි, පව් වලට සමාව ලැබේ, ඇතුලාන්ත සැනසීම ලැබේ, නැවත පව් නොකිරීමට ශක්තිය ලැබේ.
(x) රාජගුරු ප්‍රසාද ධූරය, පූජා ප්‍රසාද ධූරය, තේවාචාරි ධූරය

02. (i) ජෝබ්, ධර්මදේශකයා
(ii) ප්‍රස්ථාව පිරුළු - හිතෝපදේශය, උපදේශ - උපදේශකයා හෙවත් සිරාක්, කතාන්දර - ජෝබ්, සංකල්පනා - ධර්ම දේශකයා, ගීත - ප්‍රේම ගී
(iii) ප්‍රඥාව යනු බුද්ධිය හෝ විභාග පාස් කිරීමක් නොවන බව, යහපත අයහපත හඳුනා ගත යුතු බව, යහපත තුළ තම ජීවිත හැඩ ගස්වා ගත යුතු බව. ධර්මිෂ්ඨව දිවි ගෙවිය යුතු බව. ජීවිතයේ නිවැරදි තීරණ ගත යුතු බව වැනි කරුණු ඇතුළත් කර ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු දෙන්න.

03. (i) පාපවලට වන්දි ගෙවීම සඳහා, දෙවියන් වහන්සේ සමග යහපත් හා අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සඳහා.
(ii) සම්පූර්ණයෙන් දවන පූජා, සහභාගිකමේ පූජා, පාප පූජා, වන්දි ගෙවීමේ පූජා
(iii) සැබෑ කිතුනුවකු ලෙස ජීවත් වීමේදී තමකම නසා අන් අය වෙනුවෙන් ජීවත් විය යුතු අතර ක්‍රිස්තුන් වහන්සේ මෙන් තම ජීවිතය වුවද පරිත්‍යාග කිරීමට අවස්ථාවක් ලද විටක එසේ කළ යුතු බවත් විස්තර කරමින් ලියා ඇති කරුණුවලට ලකුණු දෙන්න.

04. (i) 6 සහ 9 කාමමිථ්‍යාචාරය නොකරව, පරදාර ආලය නොකරව
(ii) යාච්ඤා කිරීම, ශුද්ධ බයිබලය කියවීම, දිව්‍ය පූජාවට සහභාගි වීම, දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම
(iii) ශුද්ධ වූ, මරිය ගොරොත්ති තුමියගේ ජීවිතය ආදර්ශයක් කර ගනිමින් ලියා ඇති කරුණු වලට ලකුණු දෙන්න.

05. (i) බර වැඩ ගැනීම, උපදින විට පිරිමි දරුවන් මරා දැමීම, පිරිමි දරුවන් නයිල් ගඟට විසි කිරීම.
(ii) ගිවිසුමට මුල පුරන්නේ දෙවියන් වහන්සේ වීම, දෙවියන් වහන්සේ හා මිනිසා අතර අසීමිත පරතරයක් තිබීම, දෙවියන් වහන්සේ ගිවිසුම් වල පොරොන්දුවලට පක්ෂපාතී වුවද මිනිසා එම පොරොන්දු බොහෝ විට කඩ කිරීම.
(iii) ප්‍රසාද ස්නාපනයෙන් ලැබූ කැඳවීම තුළ දෙවියන් වහන්සේට සාක්ෂි දැරිය යුතු බව. යුක්තිය, සත්‍යය සාධාරණත්වය වෙනුවෙන් කටයුතු කළ යුතු බව. දේව රාජ්‍ය පතල කිරීමේ කාර්යභාරය ඉටු කළ යුතු බව ආදී කරුණු ඇතුළත්ව ලියා ඇති පිළිතුර සලකා ලකුණු දෙන්න.

06. (i) පැවිදි පූජක, පූජක නොවන පැවිදි
(ii) සාංඝික ජීවිතය, යාච්ඤාවේ ජීවිතය, සේවයේ ජීවිතය
(iii) ලියා ඇති පිළිතුරට අනුව ලකුණු දෙන්න.

07. 10, 11 පෙළපොත උදව් කරගන්න.
(i) 10 පෙළපොත 23 පිටුව
(ii) 10 පෙළපොත 59 පිටුව
(iii) 11 පෙළපොත 15 වන පාඩම
(iv) 11 පෙළපොත 09 පාඩම